# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1620/5 - 2009 සැප්තැම්බර් 22 වැනි අඟහරුවාදා - 2009.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2004 අංක 11 දරන මුදල් පනත

26 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2005 මාර්තු මස 31 වැනි දින අංක 1386/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගවල, 9 වැනි නියෝගය ඉවත් කර එතැනට පහත නියෝගය ආදේශ කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2009 අගෝස්තු මස 31,
කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

9. සෑම දේශීය පොදු දුරකථන පුවරු ජාල (දේ. පො. දු. පු. ජා.) ක්‍රියාකරුවෙකු විසින් ම, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ දුරකථන සේවා නොමැති හෝ අඩු ප්‍රදේශවල විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවලින් තුනෙන් දෙකක් ඉල්ලා සිටිය හැකිය. එක් එක් දේ. පො. දු. පු. ජා. ක්‍රියාකරුවෙකුම ඔවුන්ගේ නමින් ගෙවීම් කළ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවට පමණක් හිමිකම්පෑම කළ හැකිය. යම් වර්ෂයක විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවේ තුනෙන් දෙකක ප්‍රමාණය සඳහා අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් තුළ හිමිකම්පෑමට එවැනි යම් දේ. පො. දු. පු. ජා. ක්‍රියාකරුවෙකුම සුදුසුකම් ලබනු ඇත. එසේ වුවද පහත උපලේඛනයේ II තීරුවේ දක්වා ඇති යම් කාලපරිච්ඡේදයක් සම්බන්ධයෙන් වන විට දී එවැනි යම් ක්‍රියාකරුවෙකුට උපලේඛනයේ III වැනි තීරුවේ එයට අදාළව දක්වා ඇති දිනය දක්වා හිමිකම් පෑමට සුදුසුකම් ලැබේ.

1A - G 11743 — 780 (2009/09)

| I<br>වර්ෂය | II<br>කාල පරිච්ඡේදය | III<br>හිමිකම් පෑම කළ හැකි අවසන් දිනය | IV<br>ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු අවසන් දිනය |
|---|---|---|---|
| 2003 | 03.03.2003 - 31.03.2004 | 31.03.2009 | 31.12.2009 |
| 2004 | 01.04.2004 - 3103.2005 | 31.03.2009 | 31.12.2009 |
| 2005 | 01.04.2005 - 31.03.2006 | 31.12.2009 | 31.12.2010 |
| 2006 | 01.04.2006 - 31.03.2007 | 30.09.2010 | 31.12.2010 |
| 2007 | 01.04.2007 - 31.03.2008 | 31.12.2010 | 31.03.2011 |

තව ද 18 වැනි නියෝගයේ කුමක් සඳහන් වුව ද, ඉහත සඳහන් උපලේඛනයේ II වැනි තීරුවේ දක්වා ඇති යම් කාලපරිච්ඡේදයක දී එකතු කළ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවේ බෙදාහරිනු නොලැබූ යම් මුදලක් උපලේඛයේ IV වැනි තීරුවේ එයට අදාළව දක්වා ඇති දිනයේ දී හෝ එදිනට පෙර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු ය.

10-270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.